සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය - 2022

## ක්‍රිස්තියානි ධර්මය - I

11 ශ්‍රේණිය | කාලය පැය 1 යි

නම/ විභාග අංකයඃ

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01 පවිටු ජීවන රටාවකට යොමු වූ විට එසේ වීමට මුල් වූ කරුණු විමසා බලා අදමිටු බවින් ජනතාව මුදවාගෙන නැවත දේව සබඳතාවයට පමුණුවනු ලැබුවේ,
(1) දෙවියන්වහන්සේ ය. (2) ස්නාවක ජොහාන් ය.
(3) දිවැසිවරුන් ය. (4) ජේසුස් වහන්සේ ය.

02 යෙසායා දිවැසිවරයා පවසන ආකාරයට ජේසුස් වහන්සේ
(1) බෙත්ලෙහෙමේ විසූවන්ට බලාපොරොත්තුවක් විය.
(2) මිසරයේ විසූවන්ට සොම්නසක් විය.
(3) සමාරියේ විසූවන්ට බලපෑමක් විය.
(4) සනඳුරේ විසූවන්ට ආලෝකයක් විය.

03 දීර්ඝ කාලයක් දේව කන්නලව්වේ නිරතව විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් සිට දේව ක්‍රියාකාරීත්වයේ ප්‍රබල බව අත්දකිනු ලැබුවේ,
(1) මරියතුමී ය. (2) සෙකරියස් ය. (3) ජෝසප් ය. (4) අන්නා ය.

04 අයුක්ති සහගත ලෙස ජනතාව පෙලූ රෝම අධිරාජ්‍ය නිළධාරීන්ට ගැතිකම් නොකළේ,
(1) ලියන්නන් ය. (2) අයකැමියන් ය. (3) සාමාන්‍ය වැසියන් ය. (4) පරිසිවරුන් ය.

05 කිතුණු බව්තීස්මය ලබා ඇති ඔබ විශේෂයෙන් ම
(1) ශුද්ධාත්ම අනුහසට විවෘත වූවෙහි ය. (2) සම්පූර්ණ පවිත්‍රතාවයක් ලැබුවෙහි ය.
(3) මනස්ථාපනයට යොමු වූවෙහි ය. (4) කිතුණු සභාවේ සාමාජිකත්වය ලැබුවෙහි ය.

06 A වනාන්තරයේ දී උන්වහන්සේට බඩගිනි දැනුනි.
B කුරුස ගසේදී උන්වහන්සේට පිපාසය දැනුනි.
C ගෙත්සෙමන උයනේදී උන්වහන්සේ විඳින්න යන කුසලානේ වේදනාව දැනුනි.
ඉහත ප්‍රකාශන තුළින් ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් ගම්‍ය වන්නේ,
(1) උන්වහන්සේගේ දේවත්වයයි. (2) උන්වහන්සේගේ සහභාගීත්වයයි.
(3) උන්වහන්සේගේ මනුෂ්‍යත්වයයි. (4) උන්වහන්සේගේ සහෝදරත්වයයි.

07 ''අඳනා දෙකක් ඇති අය නැති අයට දෙත්වා. කෑම ඇති අය නැති අයට දෙත්වා.'' මෙයින් අප ලබන පණිවුඩය
(1) ආපදා අවස්ථාවල දී කෑම බෙදා දීමයි.
(2) ඇඳුම් නැති අයට ඇඳුම් ලබා දීමයි.
(3) දුප්පතුන්ට අවශ්‍ය දේ ලබා දීමයි.
(4) බෙදා ගැනීම තුළින් ක්‍රිස්තුස් වහන්සේට පිදීමට අවස්ථාව ලබා ගැනීමයි.

08 ''ව්‍යවස්ථාව ඉක්මවා යන මනුෂ්‍යත්වයේ වැදගත් බව'' පරිසිවරුන්ට අවධාරණය කළේ,
(1) සබත් දින අතක් පණ නැති මිනිසා සුව කිරීමෙනි.
(2) ලෙවී කැඳ වූ අවස්ථාවෙනි.
(3) අන්ධ බාර්තිමේයස් සුව කිරීමෙනි.
(4) ශතාධිපතියාගේ දාසයා සුව කිරීමෙනි.

09 ''වග වලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් මම ඔබ යවමි.'' ජේසුස් වහන්සේ මෙසේ සැත්තෑ දෙනාට පැවසුවේ,
(1) සමාජයේ හැමදෙනාම දුෂ්ටයන් බව දැක්වීමට ය.
(2) ධර්මදූත සේවයේදී මුහුණ දෙන භාරදූරකම දැක්වීමට ය.
(3) යක්ෂාවේශ වූවන් හා පීඩිතයන්ගෙන් සමාජය පිරී තිබෙන බව දැක්වීමට ය.
(4) බැටළුවන් මෙන් අහිංසකව ක්‍රියාකිරීමේ වැදගත්කම දැක්වීමට ය.

10 කුඩා දරුවන් වරදට පැමිණවීමේ බරපතලකම ගැන ඉගැන්වීමේ දී ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ එසේ කරන අයට
(1) දඬුවම් කළ යුතු බවයි.
(2) ඉන් වළක්වා ගන්නට ක්‍රියා කළ යුතු බවයි.
(3) ගෙල වටා ඇඹරුම් ගලක් එල්ලා මුහුදට හෙලිය යුතු බවයි.
(4) දරුණු වන සතුන් සහිත කුඩුවකට දැමිය යුතු බවයි.

11 කිතුණු අප ජේසුස් වහන්සේගේ රැළට එකතුවීමේ ඒකායන අරමුණ විය යුත්තේ,
(1) ලෞකික සැප සම්පත් හිමිකර ගැනීම යි. (2) දේව රාජ්‍ය හිමිකර ගැනීම යි.
(3) සමාජය තුළ කැපී පෙනීමට හැකි වීමයි. (4) හාස්කම් දැකීමට හැකි වීමයි.

12 ජේසුස් වහන්සේ කුරුසිය මත අවසන් හුස්ම හෙලන අවස්ථාවේ දී කළ ප්‍රකාශය වන්නේ,
(1) ''පියාණෙනි ඔවුන්ට කමා වුව මැනව.'' යනුවෙනි.
(2) ''ජෙරුසලමේ දූවරුනි මා නිසා නොහඬන්න.'' යනුවෙනි.
(3) ''පියාණෙනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි.'' යනුවෙනි.
(4) ''දෙවියන්වහන්සේ අප සමඟ සදාකාලිකව වැඩ වසන්නේ ය'' යනුවෙනි.

13 ජේසුස් වහන්සේගේ පුනර්ජීවනය පිළිබඳ විශ්වාසය නොමැති අය ක්‍රියා කරනුයේ,
(1) තමාට පැමිණෙන ගැටලු පිළිබඳ ලතවීමයි. (2) ධනය රැස්කිරීමට යොමුවීමයි.
(3) වෙනත් විශ්වාසයන් වෙත ගමන් කිරීමයි. (4) උන්වහන්සේ මළවුන් අතර සෙවීමයි.

14 දේව අභිමුඛත්වය හා බලයත් පාපයෙන් දවාලා පිරිසිදු වීමත් සංකේතවත් කරනු ලබන්නේ,
(1) ජලය මගින් ය. (2) ගින්න මගින් ය. (3) සුළඟ මගින් ය. (4) වාතය මගින් ය.

15 වර්තමාන සමාජයේ ලෞකිකත්වයට වහල් වූවන් හට ජේසු තුමා පවසන්නේ,
(1) සැමවිටම ධනය රැස් කිරීමට යොමුවන්න යනුවෙනි.
(2) ''සත්‍ය හා යුක්තිය කෙදිනක හෝ ජය ගන්නවා'' යනුවෙනි.
(3) ''නුඹේ දෙවි ස්වාමීන් වහන්සේට පමණක් නමස්කාර කරන්න'' යනුවෙනි.
(4) හාස්කම් කරනු ලබන තැන්වලින් සේවය ලබන්න යනුවෙනි.

16 විශ්මය දනවන ක්‍රියාදාමයන් හරහා දෙවියන් වහන්සේට දේව රාජ්‍ය ක්‍රමක්‍රමයෙන් වර්ධනය කරන බව ප්‍රකාශ කරන උපමාව වන්නේ,
(1) අබ ඇටයේ උපමාව ය. (2) වපුරන්නාගේ උපමාව ය.
(3) මුහුන් පිළිබඳ උපමාව ය. (4) බැටළුවන් පිළිබඳ උපමාව ය.

17 ''මුළු ඊශ්‍රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත.'' යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,
(1) මහලේ රෝගී කාන්තාව පිළිබඳව ය. (2) කපර්ණවුමේ ශතාධිපතියා පිළිබඳව ය.
(3) කුදු ස්ත්‍රිය පිළිබඳව ය. (4) ජාති අන්ධයා පිළිබඳව ය.

18 ''දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකි.'' මෙය ප්‍රකාශ කළේ,
(1) ස්නාවක ජොහාන් තුමා ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) භෝජන සංග්‍රහයට සහභාගි වූ අයෙක් ය. (4) ජේසුතුමාගේ ගෝලයෙක් ය.

19 ''නගුලට අත තබා ආපසු බලන කිසිවෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සුදුසු නොවේ.'' ජේසුස් වහන්සේ මෙය ප්‍රකාශ කළේ,
(1) ගෝලයන් දොළොස්දෙනාට ය.
(2) ජේසුස් වහන්සේ අනුගාමී වීමට කැඳවීම ලැබුවෙකුට ය.
(3) නායකත්වය දැරීමට පැමිණි අයකුට ය.
(4) ස්ව කැමැත්තෙන් ජේසුස් වහන්සේ අනුගාමී වූවකුට ය.

20 ''ස්වාමිවරුන් දෙදෙනෙකුට සේවය කිරීමට නුපුලුවන.'' මෙම බයිබල් පාඨයේ ස්වාමිවරුන් දෙදෙනෙක් යනු,
(1) දෙවියන් වහන්සේ හා ජේසුස් වහන්සේ ය. (2) දෙවියන් වහන්සේ හා වස්තුව ය.
(3) නායකයා හා සේවකයා ය. (4) දෙවියන් වහන්සේ හා අන්‍ය දෙවි දේවතාවන් ය.

21 දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වනුයේ,
(1) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමයි.
(2) ජේසුස් වහන්සේගේ පැමිණීමේ ආසන්න මොහොතයි.
(3) ජේසුස් වහන්සේගේ විනිශ්චය මොහොතයි.
(4) ජේසුස් වහන්සේගේ විනිශ්චය දවසයි.

22 ''ගැළවීම සඳහා චර්මඡේදනයට අවශ්‍යම නැත.'' යන නියමය ගනු ලැබුවේ,
(1) අන්තියෝකියේ සභාවයි. (2) ජුදෙව් මන්ත්‍රණ සභාවයි.
(3) කොරින්තියේ සභාවයි. (4) ජෙරුසලම් මන්ත්‍රණ සභාවයි.

23 ජේසුස් වහන්සේගේ නාමය අයුතු ලෙස යොදාගැනීමට යැමෙන් අනිසි විපාක ගෙන දුන් අවස්ථාව වන්නේ,
(1) ඇතන්ස් හි බොහෝ දේව රූප පිළිබඳ ක්‍රියා කිරීමයි.
(2) කොරින්තියේ සිරගත වීමයි.
(3) ස්තේවාගේ පුත්‍රයින්ගේ හැසිරීමයි.
(4) පිලිප්පිගේ සිරගෙදර මුලාදෑනියාගේ හැසිරීමයි.

24 ජේසු උපත දැනුම් දීමේ දී දාවිත්ගේ සිංහාසනය, දාවිත්ගේ වංශය, දාවිත්ගේ නුවර ලෙස දිවැස්වැකි ප්‍රකාශ කරන ලද නුවර වන්නේ,
(1) නාසරෙත් නුවරයි. (2) බෙත්ලෙහෙම් නුවරයි.
(3) ජෙරුසලම් නුවරයි. (4) කානාන් නුවරයි.

25 ''ස්වාමීනි මා ඔබගේ උපකරණයක් කරගත මැනව'' කියා යාච්ඤා කළේ,
(1) මර්සිලින් ජයකොඩි පියතුමා ය. (2) ජාකෝමේ ගොන්සාවේල්ස් පියතුමා ය.
(3) අසීසයේ ෆ්‍රැන්සිස් තුමා ය. (4) මයිකල් රුද්‍රිගු පියතුමා ය.

26 ජුදෙව්වන් අතුරින් නායක පූජකයන් හා වැඩිමහල්ලන් තේරී පත් වූයේ,
(1) විනයධරයන් අතුරිනි. (2) සද්දූසිවරුන් අතුරිනි.
(3) පරිසිවරුන් අතුරිනි. (4) ලියන්නන් අතුරිනි.

27 කායිසාරියේ සිටි, දෙවියන් වහන්සේට නොකඩවා යාච්ඤා කළ රෝම හමුදා නිළධාරියා,
(1) යායිරස් ය. (2) නිකනෝර් ය. (3) කොර්නේලියස් ය. (4)නිකදේමුස් ය.

28 පාපස්වල දී සිදුවූ විශේෂ සිදුවීමක් නොවන්නේ,
(1) එලිමස් මැගෝස් ටික කලකට අන්ධ වීම ය.
(2) සර්ගියස් පාවුලස් දහම අදහා ගැනීම ය.
(3) සාවුල්ට ඔහුගේ ග්‍රීක නම වන පාවුල් යන නමින් ඔහු හැඳින්වීම ය.
(4) උපන්දා පටන් කොර මිනිසෙකුට සුවය ලැබීම ය.

29 දෙවිවරු මිනිස් වෙසින් අප වෙත පැමිණ සිටිතියි කියා ගොනුන් ද මල් මාලා ද පාවුල්ට හා සීලස්ට පූජා කරන්නට මිනිසුන් සැරසුනේ,
(1) ජොප්පාවේ දී ය. (2) පිලිප්පියේ දී ය. (3) ලුස්ත්‍රාවේ දී ය. (4) ඉකෝනියේ දී ය.

30 අර්තේමියස් දේවාලය හා දෙමෙත්‍රියස් නම් රිදී රූප සාදන්නා ධර්ම දූත කණ්ඩායමට හමුවන්නේ,
(1) ත්‍රොවසයේ දී ය. (2) එපීසයේ දී ය. (3) කොරෙන්තියේ දී ය. (4) පිලිප්පියේ දී ය.

31 රෝමයට යන අතරතුර දී කුණාටුවට හසු වූ සිරකරුවන් සහිත නැව ගසාගෙන ආවේ ........................................ දූපතට ය.
(1) මෝල්ටාව (2) සයිප්‍රස් (3) සිසිලිය (4) ක්‍රීතය

32 පාවුල්තුමා සීසර්ගේ විනිශ්චය ඉල්ලා සිටියේ,

(1) පීලික්ස් ආණ්ඩුකාරවරයාගෙනි. (2) පෙස්තුස් ආණ්ඩුකාරවරයාගෙනි.

(3) අග්‍රිපා රජතුමාගෙනි. (4) බරනියස් ආණ්ඩුකාරවරයාගෙනි.

33 ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලට අනුව ධනවත්කම

(1) දෙවියන් වහන්සේගෙන් ලැබෙන වරමකි.

(2) දෙවියන් වහන්සේගෙන් ලැබෙන උතුම් භාග්‍යයකි.

(3) තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට මඟකි.

(4) දේව රාජ්‍යයේ පුරවැසිකම ලැබීමට බාධාවකි.

34 ජෙරුසලම් මන්ත්‍රණ සභාව හා බැඳි සාධකයක් නොවන්නේ,

(1) සැත්තෑ දෙනෙකුගෙන් සමන්විත සභාවක් වීමයි.

(2) පාවුල්ගේ ප්‍රථම ධර්මදූත සේවයෙන් පසු කැඳවනු ලැබීමයි.

(3) ජුදෙව් හා විජාතික අය අතර ඇති ගැටලු නිරාකරණය කිරීමයි.

(4) මෙහි නායකත්වය ජාකොබ්තුමා දැරීමයි.

35 යහපත් බැටළු එඬේරුන් වන කිතුණු නායකයන් තුළ දිස්විය යුතු ගුණාංගයක් නොවන්නේ,

(1) නැතිවූවන් සොයා යාම ය.

(2) ප්‍රේමයෙන් කැපවීමෙන් රැකබලා ගැනීම ය.

(3) තමාගේ රැළ මගින් ප්‍රයෝජන ලබා ගැනීම ය.

(4) සේවයට කැපවී, තමා බාරයේ ඇති අය ආරක්ෂා කිරීම ය.

36 ගරු මයිකල් ලැප්ස්ලි දේවගැතිතුමා වැදගත් වන්නේ කුමක් නිසා ද?

(1) දකුණු අප්‍රිකාවේ කළු සුදු භේදය අතර සාමයට ක්‍රියා කිරීම නිසාය.

(2) ඇමරිකාවේ කළු සුදු භේදයට එරෙහිව නැගී සිටීම නිසාය.

(3) පිවිතුරු ජීවිතයකට ජනතාව කැඳවීමේ මෙහෙවර නිසාය.

(4) දුගී අයගේ ජීවිත නඟා සිටුවීමට ක්‍රියා කිරීම නිසාය.

37 ''ඔබ කළ වරදට මම කමාව දෙමි.'' කියා පවසා, ජේසුස් වහන්සේගේ උතුම් ගුණාංගය ක්‍රියාත්මක කළ මෑත කාලීන පුද්ගලයකු නම්,

(1) දෙවන ජුවාම් පාවුලු පාප්තුමා ය. (2) ගරු චන්ද්‍ර ප්‍රනාන්දු දේවගැතිතුමා ය.

(3) තිස්ස බාලසූරිය පියතුමා ය. (4) නෙල්සන් මැන්ඩෙලා ය.

38 අද සමාජයේ යුක්තියට පිටුපා තම හෘද සාක්ෂියට විරුද්ධ ව තම ජනප්‍රියභාවය සඳහා ක්‍රියා කරන අය සමාන වන්නේ,

(1) පේදුරුතුමාට ය. (2) පිලාත් ආණ්ඩුකාරයාට ය.

(3) ස්නාවක ජොහාන්ට ය. (4) මග්දලායේ මරියාට ය.

39 ජේසුස් වහන්සේගේ මිත්‍රයෙකු ලෙස අන්ත දුක් පීඩාවලට මුහුණ දීමේ දී අපේ ප්‍රතිචාර විය යුත්තේ,

(1) එම තත්වය වෙනස් කිරීමට සෑම ප්‍රයත්නයක්ම දැරීම ය.

(2) ''දේව කැමැත්ත වේවා'' කියා යාච්ඤා කිරීම ය.

(3) අපට උදව් වන අය සමග මිත්‍ර සබඳතාවක් ගොඩ නගා ගැනීම ය.

(4) අපේ ම අභ්‍යන්තර ශක්තියෙන් එය දරා ගැනීමට යොමුවීම ය.

40 සහජීවනයෙන් බහුවිධ සමාජයක ජීවත්වන කිතුණුවකු අවනත නොවිය යුත්තේ,

(1) අන්‍ය ආගමිකයන් හා ජාතීන් සමග ඔවුන්ගේ උත්සවවලට සහභාගි වීම ය.

(2) සංස්කෘති උත්සව ආදියේ දී කිතුණු අනන්‍යතාව රැක ගැනීම ය.

(3) සියලු ආගම්වල සමානත්වයක් ඇති බව පිළිගැනීම ය.

(4) සමාජ සේවා ක්‍රියාවලියේ දී සියලු දෙනා සමග එක්වීම ය.

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය - 2022

## ක්‍රිස්තියානි ධර්මය - II

11 ශ්‍රේණිය | කාලය පැය 2 යි

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

---

01 පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(1) සෙකරියස් පූජක තුමාගේ ජීවිතයේ කැපී පෙනෙන ගුණාංග 2 ක් ලියන්න.

(2) ''ජෙරුසලම් දේව මාළිගාව'' හා ''සිනගෝගය'' මෙම ස්ථානවල ප්‍රධාන කාර්යය වූයේ කුමක් ද?

(3) ධර්මදූත චාරිකාවල දී ලද ප්‍රතිඵල 2 ක් ලියන්න.

(4) රෝම ආණ්ඩුකාරයා ඉදිරියේ ජේසුස් වහන්සේට විරුද්ධව නැගූ චෝදනා 2 ක් ලියන්න.

(5) 'දුක් උසුලන සේවකයාණෝ' පිළිබඳව අනාවැකි පළ කළේ කුමන දිවැසිවරයා ද? නව ගිවිසුම තුළ එම කාර්යය සම්පූර්ණත්වයට පත් කළේ කවුද?

(6) ''පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදිව යාච්ඤා කරන්න.'' මෙසේ ප්‍රකාශ කළේ කවුද? කාටද?

(7) ආබ්‍රහම්ගේ වංශයේ විශාලත්වය දැක්වීමට දෙවියන් වහන්සේ භාවිත කළ සංකේත 2 ලියන්න.

(8) දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති හුවා දැක්වීමට යොදාගත් උපමා කතා 2 ක් ලියන්න.

(9) සිරියාවේ අන්තියෝකියෙන් ඇරඹුන පළමු ධර්මදූත ගමනට එක් වූ දෙදෙනෙකු නම් කරන්න.

(10) ''තමන්ගේ කඩු වලින් නගුල් තල ද හෙල්ල වලින් දැකැති ද තලා ගනු ලබයි.'' මෙසේ පැවසූ දිවැසිවරයා කවුද? මෙම ප්‍රකාශයෙන් අර්ථ ගැන්වෙන්නේ කුමක් ද?

(ලකුණු 10 x 2 = 10)

02. ''මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවා.''

(1) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේදී ද? මින් ලැබෙන මඟපෙන්වීම කුමක් ද?

(2) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ පුද්ගලයින් තිදෙනෙකු නම් කරන්න.

(3) ජේසුස් වහන්සේ ජීවමාන බව අත්දැකීමට කිතුණු ඔබට ඇති බාධා 3 ක් සඳහන් කර එම බාධක ජය ගැනීමට ක්‍රියා කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 2+3+5= 10)

03. (1) කිතුණුවන් තුළ ඇති ජයග්‍රාහී බලාපොරොත්තුව කුමක් ද?

(2) එම ජයග්‍රාහී බලාපොරොත්තුව ඉටුකර ගැනීමට අපේ ජීවිත පරිවර්තනය සඳහා අවශ්‍ය කරුණු 3 ක් සඳහන් කරන්න.

(3) කිතුණු දරුවන් ලෙස ඔබ ශුද්ධකමේ ලක්ෂණය පෙරදැරි කරගෙන සමාජය තුළ ක්‍රියා කරන ආකාරය කරුණු 5 ක් ලියන්න.

(ලකුණු 2+3+5= 10)

04. ''නැති වූවන් සොයා යාම දේව රාජ්‍යයේ ප්‍රතිපත්තියකි.''

(1) ජුදා සමාජය තුළ කොන් කර සිටියා වූ ජන කණ්ඩායම් 2 ක් ලියන්න.

(2) ජේසුස් වහන්සේ මෙම කොන් වූවන් වෙනුවෙන් මැදිහත් වූ අවස්ථා 3 ක් ශුද්ධ බයිබලය ඇසුරින් ලියන්න.

(3) අපේ සමාජයේ, අවශ්‍යතා ඇති, ඔබේ මිතුරෙකු / මිතුරියක වෙනුවෙන් ඔබට කළ හැකි දේවල් 5 ක් ලියන්න.

(ලකුණු 2+3+5= 10)

05. (1) i. පාවුල් තුමා දෙවන ධර්මදූත ගමනේදී ජොහාන් මාර්ක් ගෙනයාමට තදින්ම විරුද්ධ වූයේ ඇයි ?

ii. එහි ප්‍රතිඵලය වූයේ කුමක් ද?

(2) දෙවන ධර්මදූත ගමනට පාවුල්තුමා සමග එක් වූ තිදෙනෙක් නම් කරන්න.

(3) දෙවන ධර්මදූත ගමනේ දී පාවුල් තුමා මුහුණ දුන් අභියෝග 3 ක් සඳහන් කර එම අභියෝග ජයගත් අයුරු සඳහන් කර, ඉන් ඔබ ලබන පණිවිඩ 2 ක් ලියන්න.

(ලකුණු 2+3+5= 10)

06. ''මනුෂ්‍ය පුත්‍රයාණෝ සබත් දිනට පවා අධිපතියාණෝ ය.''

(1) ජේසුස් වහන්සේ ඉහත ප්‍රකාශය කිරීමට තුඩු දුන් හේතුව ලියන්න.

(2) ජේසුස් වහන්සේ නීතියට වඩා මනුෂ්‍යත්වය උතුම් බව දැක්වීමට කළ ක්‍රියාවන් 3 ක් ලියන්න.

(3) ජේසුස් වහන්සේ ක්‍රියා කළ ආකාරය අනුව කිතුණු ඔබ සමාජ සාධාරණත්වය හා යහපත උදෙසා ගත් ක්‍රියාමාර්ග 5 ක් ලියන්න.

(ලකුණු 2+3+5= 10)

07 පහත සඳහන් මාතෘකා අතුරින් දෙකක් තෝරාගෙන බයිබලීය ඉගැන්වීම් පදනම් කරගෙන ලුහුඩු සටහන් ලියන්න.

(1) <u>පෙරමග දූත කාර්යය</u>

මෙම කාර්යය ඉටුකළ පුද්ගලයා / ඔහු ජීවත් වූ පරිසරය / ඇඳුම හා ආහාර / ඔහු ජොර්දාන් ගඟ අසල රැස් වූ ජනතාවට දුන් පණිවිඩය / සාමාන්‍ය ජනතාවට අයකැමියන්ට හේවායන්ට දුන් පණිවිඩය / ජේසුස් වහන්සේ මොහුගේ ක්‍රියා කලාපය අනුමත කළ අයුරු

(2) <u>ජේසුස් වහන්සේ පාවා දීම</u>

සිදුවූ අවස්ථාව / ස්ථානය / පාවා දුන් පුද්ගලයා හා ඔහු එය සිදුකළ ආකාරය / ජේසුස් වහන්සේ ඔහුට පැවසූ වදන් / අනෙකුත් ගෝලයන් එම අවස්ථාවේ ක්‍රියා කළ ආකාරය / ඊට ජේසුස් වහන්සේ දක්වූ ප්‍රතිචාරය

(3) <u>පරික්ෂාවන් ජය ගනිමු.</u>

ජේසුතුමාට පැමිණි පරික්ෂාවන් / ඊට ලබා දුන් පිළිතුරු / අද ඔබට එල්ල වන පරීක්ෂා / එම පරීක්ෂාවන් ජය ගන්නා ආකාරය

(4) <u>ප්‍රේමයෙන් දිවි ගෙවමු.</u>

පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාවය / ප්‍රේමයෙන් ඈත් වූ මිනිසා තුළ ඇති දූෂිත තත්වයන් / ප්‍රේමය තුළ පවතින ගුණාංග / ප්‍රේමය නොමැති තැනැත්තා සමාන කළ දේ / ප්‍රේමය පිළිබඳ පවතින ශ්‍රේෂ්ඨතම ආඥාව

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 3 ) | 02. ( 4 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 1 ) | 06. ( 3 ) | 07. ( 4 ) | 08. ( 1 ) | 09. ( 2 ) | 10. ( 3 ) |
| 11. ( 2 ) | 12. ( 3 ) | 13. ( 3 ) | 14. ( 2 ) | 15. ( 3 ) | 16. ( 3 ) | 17. ( 1 ) | 18. ( 3 ) | 19. ( 4 ) | 20. ( 2 ) |
| 21. ( 1 ) | 22. ( 4 ) | 23. ( 3 ) | 24. ( 2 ) | 25. ( 3 ) | 26. ( 2 ) | 27. ( 3 ) | 28. ( 4 ) | 29. ( 3 ) | 30. ( 3 ) |
| 31. ( 4 ) | 32. ( 1 ) | 33. ( 4 ) | 34. ( 2 ) | 35. ( 3 ) | 36. ( 1 ) | 37. ( 1 ) | 38. ( 2 ) | 39. ( 2 ) | 40. ( 3 ) |

(ලකුණු 40)

## II පත්‍රය

01. (1) දේව පණත් නිසි ලෙස ඉටුකිරීම / දේව ගරු බිය දැහැමි බව / දේව විශ්වාසය

(2) ජෙරුසලම් දේව මාළිගාව - ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය

සිනගෝගය - ආගමික දැනුම ඉගැන්වීම

(3) රටපුරා සුබ අස්න ප්‍රකාශ කිරීම / දෙවියන් වහන්සේගේ නාමය තුළ රෝගීන් සුවය ලැබීම / දුෂ්ට ආත්ම යටත් වීම

(4) ජාතිය කැරලි ගැසීමට පෙළඹවීම / අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම / තමා ක්‍රිස්තුස් නම් රජෙකු බව ප්‍රකාශ කිරීම

(5) යෙසායා දිවැසිවරයා / ජේසුස් වහන්සේ

(6) ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ට

(7) පොළවේ දූවිලි / අහසේ තාරකා

(8) මහා මංගල භෝජනය / නැති වූ බැටළුවා / නැති වූ කාසිය

(9) පාවුල් / බාර්ණබස් / ජොහන් මාර්ක්

(10) මීකා දිවැසිවරයා - යුද මානසිකත්වයෙන් මිදී කෘෂිකාර්මික ජීවන රටාවකට මුල්තැන දී සාමකාමී දිවි පෙවෙතක් ගත කරන බව (ලකුණු $2 \times 10 = 20$)

02. (1) ජේසුස් වහන්සේ ගෙත්සෙමන උයනේ යාච්ඤා කරන අවස්ථාවේ. / දේව කැමැත්තට මුල්තැන දීම.

(2) සිරේනියේ සීමොන් / සොරෙකු / අරිමාතියේ ජෝසප්

(3)
* ජේසුස් වහන්සේ ජීවමාන බව විශ්වාස නොකිරීම.
* අන් අයගේ බලපෑම්වලට නතුවීම.
* දේව කැමැත්තෙන් බැහැර වී පාපයට නැඹුරු වීම.
* ලෞකික දේවල් පසු පස යාම.

මෙම බාධා වලින් ජය ගැනීමට නම් දේව වචනය අනුව ජීවිත හැඩගස්වා ගැනීම, යාච්ඤා කිරීම.

(ලකුණු $2 + 3 + 5 = 10$)

03. (1) සදාකාල ජීවනය උරුම කර ගැනීම.

(2) ධර්මිෂ්ටකම / ශුද්ධකම / උතුම් ප්‍රීතිය

(3)
* උත්ථාන වූ ජේසුස් වහන්සේ මහිමයට පත් කිරීම.
* තෘෂ්ණාවලට වහල් නොවීම.
* කීකරු දරුවන් ලෙස හැසිරීම.
* දේව ගරුබිය ඇති ජීවිතයක් ගත කිරීම.
* නිෂ්ඵල ජීවිත මාර්ග වලින් මිදීම.
* තමකම නසා පරාර්ථකාමීව ජීවත් වීම.
* හැසිරීමෙන් ශුද්ධ වන්තව සිටීම. (ලකුණු $2 + 3 + 5 = 10$)

04 (1) අයකැමියන් / කාන්තාවන් / දරුවන් / අන්‍ය ජාතීන් / එඬේරුන් / රෝගීන්

(2) සකෙවුස් / පව්කාර ස්ත්‍රිය / සමාරි ස්ත්‍රිය / ලාදුරු රෝගීන්

(3) ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න. (ලකුණු $2 + 3 + 5 = 10$)

05 (1) i. පළමු ධර්මදූත ගමනේ දී පර්ගාවල දී ජොහාන් මාර්ක් හැරී ගිය බැවින්

ii. බාර්ණබස් ජොහාන් මාර්ක් කැටුව වෙනම ගමන් කිරීම.

(2) තිමෝතියස් / සීලස් / ලූක්

(3) * සිරගත කිරීම

* බහු ආගමික පරිසරයක දහම දේශනා කිරීම

* ආර්ථික අවශ්‍යතා මතුවීම

අභියෝග ජයගත් ආකාරය

නොපසුබට වීර්යය / ස්ථානෝචිත ප්‍රඥාව / කූඩාරම් කර්මාන්තයේ නියැලීම (ලකුණු $2+3+5=10$)

06 (1) කෙතක් මැදින් ගමන් කිරීමේ දී ජේසුස් වහන්සේගේ ගෝලයෝ කරල් අතින් පොඩිකර කෑම සිද්ධියේ දී චෝදනා කළ විට

(2) * සබත් දින දිය උදර රෝගියකු සුව කිරීම.

* සබත් දින අත පණ නැති මිනිසා සුව කිරීම.

* ලාදුරු රෝගීන් සුව කිරීම.

* අංශභාග රෝගියාට පව්කමාව දානය කිරීම.

(3) * ඉරුදින වුවත් අවශ්‍යතා ඇති අයට උදව් කිරීම.

* රෝගී අය උදෙසා යාච්ඤා කිරීම.

* රෝගීන්ට උපස්ථාන කිරීම.

* තරාතිරම් නොබලා උදව් කිරීම.

* යමෙකු වරදට පෙළඹී සිටිනම් ඔහුව / ඇයව ඉන් මුදවා ගැනීම.

* ප්‍රේමය මත පදනම්ව කටයුතු කිරීම. (ලකුණු $2+3+5=10$)

07 (1) ස්නාවක ජොහාන් තුමා / වනගතව / ඔටුලෝම වස්ත්‍රයක් ඇඳ ඉණට සම් පටියක් බැඳ සිටීම / පළගැටියන් හා වණ මී ආහාරයට ගැනීම / පව් කමාව ලබන පිණිස පසුතැවිලි වී භෞතීස්ම ස්නාපනය ලබාගැනීම / අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා / කෑම ඇති අය නැති අයට දෙත්වා / නියමිත පමණට වැඩියෙන් අයබදු අය නොකරන්න / කිසිවෙකුගෙන් කිසි දෙයක් බලහත්කාරයෙන් පැහැර නොගන්න / ලැබෙන වැටුපෙන් සෑහීමකට පත්වෙන්න / ජේසුස් වහන්සේ ද ජොර්දාන් ගඟේ ස්නාවක ජොහාන් තුමා අතින් භෞතීස්මය ලබා ගැනීම.

(2) අන්තිම රාත්‍රී භෝජනයෙන් පසු ගෝලයන් සමග ගෙත්සෙමන උයනේ යාච්ඤා කරමින් සිටින අවස්ථාවේ / ජුදස් ස්කාරියොත් විසින් සිඹීමතින් පවා දෙන ලදී / ජුදස් නුඹ සිඹීමතින් මනුෂ්‍ය පුත්‍රයා පාවා දෙන්නේදැයි ජේසුස් වහන්සේ අසන ලදී / සෙසු ගෝලයින් අත තිබූ කඩුවක් රැගෙන උත්තම පූජකයාගේ දාසයාට ගසා කන කපා දමන ලදී. ''ඔය ඇති නවතින්න කියා ජේසුස් වහන්සේ ඔහුගේ කන අතගා සුව කරන ලදී.''

(3) පරීක්ෂාවන් ජය ගනිමු.

ජේසුතුමාට පැමිණි පරීක්ෂාවන් හා ඊට දුන් පිළිතුරු අද ඔබට එල්ල වන පරීක්ෂාවන් හා එම පරීක්ෂාවන් ජයගන්නා ආකාරය (ලියා ඇති පිළිතුරු අනුව ලකුණු ලබාදෙන්න. පිටුව 10 පෙළ පොත 79, 80, 81)

(4) ශ්‍රේෂ්ටතම ධර්මතාවය ප්‍රේමයයි. අනුවණකම, පළිගැනීම, උඩඟුකම, ඊර්ෂ්‍යාව, තණ්හාව, ක්‍රෝධය, ආත්මාර්ථකාමීකම වැනි දේ තුළින් මිනිසා දූෂිත වී සිටීම / ප්‍රේම පාරමිතාවේ අඩංගු කරුණු ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (10 ශ්‍රේණිය 16 පිටුව) ප්‍රේමය නොමැති තැනැත්තා ඝෝෂා කරන ඝණ්ටාරයකට හෝ කටුක රාවය දෙන කෛතාලමකට සමාන බව / තමාගේ මුළු හෘදයෙන්ම දෙවියන් වහන්සේට සේවය කිරීම හා තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කිරීම (ලකුණු $5+5=10$)